https://doi.org/10.4038/sljarshss.v13i2.16

*Sri Lanka Journal of Advanced Research Studies in Humanities and Social Sciences*
*Vol. 13. No. 2 July-December 2023*

# ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික පහතරට නර්තන කලාව සහ සංචාරක කර්මාන්තය

# Srilankan Traditional Low Country Dance and Tourism Industry

Ranganath Sudarshana De Silva
Department of Fine Arts, University of Kelaniya
ranganaths@kln.ac.lk

**Abstract**

The purpose of the present research paper is to examine the possibility of applying low country dance as a branding product for the promotion of the current tourism industry in Sri Lanka. Among the traditional dance arts of Sri Lanka, the low country dance tradition can be identified as a unique dance tradition that reflects diverse local cultural identity at its best. The notable characteristic of the low country dance form its choreography, elegant costumes, the masks and the dramatic elements representing all Abhinaya aspects i.e. nrtta, nrtya, natya. Unlike other dance traditions, low country dance tradition reflects the unique characteristics of local culture and techniques where dramaturgy plays a major role. The significant nature provides a better platform to identify low-country dance as a branding item to promote tourism in the country and it will enable the Sri Lanka's tourism to reach an important milestone in the current tourism industry while promoting local/vernacular products among tourists. The study applied a mixed method to collect and analyze data: whereas the primary sources and the elements of low country dance tradition was examined to identify the unique characteristics of the particular dance tradition, the quantitative survey was conducted to examine the thoughts, ideas, opinions and the attraction of the audience. The participants were selected on random basis by using convenient sampling method and the information was collected through questionnaires and interviews. Ethical clearance was obtained prior to collecting data from the selected participants. Through this, data were collected on the responses of tourists to the low country dance art of Sri Lanka and their awareness of it. Literature survey was conducted prior to the field survey to identify the essential characteristics of the traditional low country dance tradition. The analysis of the data confirmed that there are many shortcomings between the tourism sector and the dance sector, and it was confirmed that those involved in the tourism industry should pay attention to the contribution that local arts can make a significant contribution to promote their industry. Accordingly, it was concluded that low country dance, which reflects the essential characteristics of local art, and other related arts can be used as guiding factors to promote Tourism industry in the country.

***Keywords:*** *Lowcountry dance tradition, mask, tourism industry, theatrical costumes*

**සංක්ෂෙපය**

ශ්‍රී ලංකාවේ වර්තමාන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා පහතරට නර්තන කලාව නිෂ්පාදිතයක් ලෙස උපයෝගී කර ගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ වේ. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නර්තන කලා අතුරින් දේශීය අනන්‍යතාව මානව පිළිබිඹු කෙරෙන නර්තන සම්ප්‍රදායක් ලෙස පහතරට නර්තන සම්ප්‍රදාය හඳුනා ගත හැක. විශේෂයෙන්ම, පහතරට නර්තන සම්ප්‍රදායේ දී භාවිත රංග වින්‍යාස, රංග වස්ත්‍රාභරණ මෙන්ම වෙස් මුහුණු ද දේශීය සංස්කෘතිය හා ශිල්ප ක්‍රමවල අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කිරීමට සමත්වීම කැපීපෙනේ. එබැවින් සංචාරක නිෂ්පාදිතයක් වශයෙන් එම නර්තන කලාව උපයෝගී කරගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසා ගන්නේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වර්තමාන සංචාරක කර්මාන්තය සහ දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය පිළිබඳ වැදගත් සන්ධිස්ථානයක් විය හැකි බව පැහැදිලි ය. මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය ලෙස සම්ප්‍රදායික පහතරට නර්තන සම්ප්‍රදායේ අනන්‍ය ලක්ෂණ හඳුනා ගැනීම සඳහා සාහිත්‍යමය මූලාශ්‍ර අධ්‍යනයක් ද එහි ව්‍යවහාරික සහ ප්‍රායෝගික ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ක්ෂේත්‍ර ගවේෂණ යන ක්‍රම උපයෝගී කරගැනිණි. එමගින් සංචාරකයන් ශ්‍රී ලංකාවේ පහතරට නර්තන කලාවට දක්වන ප්‍රතිචාර හා ඒ පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය පිළිබඳ ඔවුන්ගේ දත්ත රැස් කරගන්නා ලදී. එම දත්ත විශ්ලේෂණය මගින් සංචාරක ක්ෂේත්‍රය සහ නර්තන ක්ෂේත්‍රය අතර අන්‍යෝන්‍ය වශයෙන් අඩුපාඩු රැසක් පවතින බව තහවුරු කරගත හැකි අතර මූලික වශයෙන්ම සංචාරක කර්මාන්තයෙහි නියැලෙන්නන් තම කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා සමස්තයක් ලෙස දේශීය කලාවන්ගේ ලබා ගත හැකි දායකත්වය පිළිබඳ අවදානය යොමු වියයුතු බව තහවුරුවිය. ඒ අනුව දේශීය කලාවෙහි අනන්‍ය ලක්ෂණ පිළිබිඹු වන පහතරට නර්තන සහ ඒ හා බැඳී අවශේෂ කලාංග ප්‍රමඛ සාධක ලෙස උපයෝගී කරගත හැකි බව නිගමනය කල හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** පහතරට නර්තන සම්ප්‍රදාය, වෙස් මුහුණ, සංචාරක කර්මාන්තය, රංග වස්ත්‍ර

**පර්යේෂණ පසුබිම**

ලෝකයේ සීග්‍රයෙන් දියුණුවන කර්මාන්තයක් වශයෙන් සංචාරක කර්මාන්තය හඳුන්වාදිය හැක. සංචාරක කර්මාන්තය ආරම්භ වූ මුල් අවධියේ පටන් සංචාරකයා වඩාත් ආකර්ෂණය වන සංචාරක නිෂ්පාදිතයක් වශයෙන් සංස්කෘතික සංචරණය ප්‍රධාන වේ. මේ සඳහා විවිධ රටවල පවතින නස්පර්ශිත හා ස්පර්ශිත සංස්කෘතික අංගයන් භාවිතයට ගනී. සංස්කෘතික සංචරණය සඳහා වැඩි නැඹුරුවක් ඇති රටවල් නස්පර්ශිත සංස්කෘතික අංගයක් වශයෙන් නර්තනය යොදා ගැනීම ද සිදුවේ. මේ නිසාම සංස්කෘතික අනන්‍යතාවය නිරූපණයටත් විනෝදාස්වාදය සැපයීමේ මාධ්‍යයක් වශයෙන් සංචාරකයන් තුළ මේ සඳහා විශේෂ ආකර්ෂණයක් පවතී. චීනය, ජපානය, ඉන්දියාව, බාලි වැනි රටවල් මේ බව හොඳින් වටහාගෙන තම රටවල්හි සංචාරක කර්මාන්තයට නර්තන කලාවන් මැනවින් යොදා ගැනීම් සිදු කරයි. ශ්‍රී ලංකාව ද සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාමේ දී සංස්කෘතික සංචරණය සඳහා අතීතයේ පටන් නැඹුරුවක් පැවැති රටකි. සංස්කෘතික සංචරණය

සඳහා නර්තනය යොදා ගැනීම ද ශ්‍රී ලංකාව තුළ සිදුවේ. උඩරට, පහතරට, සබරගමු වශයෙන් නර්තන කලාව ත්‍රිත්වයක් ලක්දිව තුළ පැවතිය ද ඉන් උඩරට නර්තන කලාව පමණක් වඩාත් භාවිතයට ගැනීමක් දැක ගත හැක. නර්තනය සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සංකේතයක් ලෙස මෙන් ම යම් රටකට ආකර්ෂණය වන සංචාරකයන් සඳහා නිෂ්පාදිතයක් ලෙස සංස්කෘතිය හුවා දැක්වීමටත් විනෝදාස්වාදය සැපයීමටත් ප්‍රධාන වශයෙන් යොදාගනී. එහෙත් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ මේ සෑම අවස්ථාවක් සඳහාම උඩරට නර්තන කලාවට වඩා වැඩි ඉඩක් වෙන් වී ඇත. උඩරට නර්තන කලාවට වඩා වැඩි විචිත්‍රත්වයකින් හා විවිධත්වයකින් යුත් ආකර්ෂණය කර ගැනීම සඳහා තවමත් පහතරට නර්තනයට මේ සඳහා අවස්ථාව හිමි වී නැත. සබරගමු නර්තනය තුළ විශාල විවිධත්වයක් විචිත්‍රත්වයක් අන්තර්ගත නොවන හෙයින් එය සාමාන්‍ය මට්ටමින් භාවිතයට ගැනීම එතරම් ගැටලුවක් නොවේ. පහතරට නර්තනය හරහා සංචාරකයන් ආකර්ශනය කර ගැනීම සඳහා තවමත් පහතරට නර්තනය ප්‍රවර්ධනය වී නොතිබීමත් එය පවතින තත්ත්වයට වඩා සංචාරක කර්මාන්තය තුළ ප්‍රචලිත කිරීමටත් අවශ්‍ය පසුබිම සොයා බැලීම සඳහා මෙම පර්යේෂණයේ දී සිදුකරනු ලබයි.

මෙම අධ්‍යනය සිදු කිරීමේ දී හඳුනාගත හැකි සීමා රැසකි. පහතරට නැටුම් කලාවේ උපත පැවත එන පහතරට ප්‍රදේශ තුළින් පමණක් නැටුම් සංදර්ශන පවත්වන හෝටල් කිහිපයක් තෝරා ගැනීමට සිදුවිය. එමෙන්ම ප්‍රාථමික දත්ත සපයා ගැනීමට ප්‍රශ්නාවලිය ඉදිරිපත් කිරීමට හා සම්මුඛ සාකච්ඡා ලබා ගැනීමට එම හෝටල් ආශ්‍රිතව සිටින සංචාරකයන් පමණක් තෝරා ගැනීමට සිදුවිය. එයිනුත් නර්තනය පිළිබඳ කැමැත්ත හා පහතරට නැටුම් පිළිබඳ ආකල්පය දැන ගැනීමට අදාළ හෝටල්වල නර්තන සංදර්ශන නැරඹූ සංචාරකයන් පමණක් තෝරා ගැනීමට සිදුවිය. එමෙන්ම නර්තනය වනාහි සංස්කෘතික සංචරණයේ එක් කොටසක් වන නිසාත් විනෝද විනෝදාස්වාදය සැපයීම සඳහා යොදා ගැනෙන මාධ්‍යයක් නිසාත් නර්තනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් පිළිබඳ පැහැදිලි සංඛ්‍යාත්මක දත්ත වාර්ථා රජයේ හෝ පෞද්ගලික අංශයේ කිසිදු ආයතනයකින් ලබා ගත නොහැකි විය. ඒ නිසා ගුණාත්මක දත්ත මත පමණක් පදනම් වීමට සිදුවිය. එමෙන්ම මෙම පර්යේෂණය කිරීම තුළින් මූලික අරමුණු කිහිපයක් මුදුන් පමුණුවා ගැනීමට බලාපොරොත්තු විය. එනම්,

1. පහතරට නර්තන කලාව ශ්‍රී ලංකාවේ සංචාරක නිෂ්පාදිතයක් ලෙස ලබා දීමේ වැදගත්කම හඳුනා ගැනීම.
2. සංචාරක කර්මාන්තය තුළ නර්තනය යොදා ගෙන ඇති ආකාරය හඳුනා ගැනීම.
3. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් ශ්‍රී ලංකාවේ නර්තන කලාවන් පිළිබඳ හා විශේෂයෙන් පහතරට නර්තන කලාව සංචාරක කර්මාන්තයට යොදා ගැනීම පිළිබඳ දරණ මතය හඳුනාගැනීම.
4. සාම්ප්‍රදායික පහතරට කලාව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට යොදා ගැනීමේ දී ඇතිවිය හැකි ගැටලු හා ඒවාට විසඳුම් හඳුනා හඳුනාගැනීම.

සමස්ත පර්යේෂණය සිදු කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදයක් ලෙස ප්‍රාථමික දත්ත සපයා ගැනීමට සම්මුඛ සාකච්ඡා නිරීක්ෂණ සහ ප්‍රශ්නාවලි යන ක්‍රමවේදයන්

උපයෝගී කරගැනිණි. එහිදී දේශීය නර්තන ශිල්පීන් ලබා ගැනීමට අවශ්‍ය කරුණු සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ද නර්තනය පිළිබඳව වර්තමාන තත්ත්වය හා වෙනස්වීම් හා හඳුනා ගැනීමට නම් නර්තනය සංදර්ශන නැරඹීම්ද විදේශීය සංචාරක ප්‍රජාව ගේ අදහස් ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලිය ද භාවිතයට ගැනිණි. එමෙන්ම ද්විතීක මූලාශ්‍ර වශයෙන් තොරතුරු ලබාගැනීමට පොත් සඟරා, වාර්තා, දේශන හා අන්තර්ජාලය යොදා ගැනීම. පර්යේෂණ සිදු කිරීමේ වැදගත්කම වශයෙන් හඳුනාගත හැක්කේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ නව ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමේදී නව ආකර්ෂණයක් ලෙස පහතරට නර්තනය යොදා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

එමෙන් ම මෙම පර්යේෂණයේ අධ්‍යයන පෙළගැස්මට අනුව පහතරට නැටුම් යනු කුමක්ද? සංචාරක කර්මාන්තය හා නර්තනය යන්න පිළිබඳ සොයා බැලීමේ දී සංචාරක කර්මාන්තය යනු කුමක්ද? ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කුමන ආකාරයේ ද? යන්න හඳුන්වා ලෝකයේ සංචාරක කර්මාන්ත තුළ නර්තනය කුමන ආකාරයෙන් පවතී ද? හා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ නර්තනය කුමන ආකාරයෙන් පවතී ද? යන්න සොයා බැලීම සිදු වී ඇත. සංචාරක ආකර්ෂණයක් ලෙස ශ්‍රී ලංකාවේ නර්තනය යොදා ගැනීම ද සංචාරක කර්මාන්තය තුළ පහතරට නර්තන කලාව පවතින ආකාරය පිළිබඳ සාකච්ඡා කෙරේ. අනතුරුව ප්‍රශ්ණාවලිය මඟින් හා අනිකුත් ක්‍රමවේද ඔස්සේ ලබාගත් දත්ත ප්‍රතිශතයක් ලෙස ගෙන විශ්ලේෂණයයට භාජනය කර ඇත. එමගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ පහතරට නර්තනය යොදා ගැනීමේදී ඇති ගැටලු හා ශක්‍යතා පෙන්වා දී ඇත. පහතරට නර්තන කලාව සංචාරක කර්මාන්තය හා ප්‍රවර්ධන අවසානයේදී තුළ දී දත්ත සියල්ල විශ්ලේෂණය මඟින් ලබාගත් ප්‍රතිඵලය අනුව එළැඹුන නිගමනය හා පහතරට නර්තනය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ ව්‍යාප්ත කිරීමට අවශ්‍ය යෝජනා කීපයක් ඉදිරිපත් කර ඇත. මේ ආකාරයට සමස්ත පර්යේෂණය ඉතා සංක්ෂිප්තව හඳුන්වා දිය හැක.

**සාකච්ඡාව**

**පහතරට නැටුම් කලාවේ පසුබිම**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික උඩරට, පහතරට, සබරගමු නර්තන කලාවන් අතරින් රටේ භූමි ප්‍රමාණයෙන් වැඩිපුරම ප්‍රතිශතයක් පුරා විසිරී පවතින්නේ පහතරට නැටුම වේ. නිමල් ප්‍රේමතිලක මහතාගේ "අපේ දේශීය නැටුම් කලාව" නම් ග්‍රන්ථයට අනුව *හලාවත, ගම්පහ', කොළඹ, කළුතර, පොකුණුවිට, ගාල්ල, වැලිගම, මාතර, තංගල්ල*, යන ප්‍රදේශය පුරාම පහතරට නැටුම් ව්‍යාප්තිය දැක ගත් හැකි බව පෙන්වා දී ඇත. (ප්‍රේමතිලක,1992:32) සරළ ගැමි සමාජය තුළින් ගොඩනැඟී ඇති මෙහි නර්තන, ගායන, වාදන, අංගයන් ගණනය කළ නොහැකි තරම් අන්තර්ගතව ඇත. නෘත, නෘත්‍ය හා නාට්‍යමය ලක්ෂණයන්ගෙන් මෙන්ම සතර අභිනය මෙම නර්තනය සුපෝෂණය වී ඇත. මේ බව මහාචාර්ය වෝල්ටර් මාරසිංහයන් විසින් කෝට්ටේගොඩ ශූරීන්ගේ "ප්‍රායෝගික පහතරට නර්තනය" නම් ග්‍රන්ථයේ සඳහන් කර ඇත්තේ මෙසේය. දේශීය නර්තන සම්ප්‍රදායන් අතුරින් පහතරට නර්තනය ප්‍රකාශන ශක්තියෙන් හා නාට්‍යමය ගුණයෙන් අභිබවා සිටී. (කෝට්ටේගොඩ,1996ඃඑසසස*ග පූජාර්ථය මූලික අරමුණු කොට ගෙන සෙතක්

ශාන්තියක් අපේක්ෂාවෙන් පවත්වනු ලැබූ ශාන්තිකර්ම ආශ්‍රයෙන් ගොඩනැගුණු මෙම පහතරට නර්තනය වර්තමානය වනවිට විනෝදාස්වාදය හා මූල්‍ය අරමුණ පාදක කොට ගෙන ඉදිරිපත් කරනු ලබයි. පහතරට නර්තනයේ වන්දනාවට පාත්‍රවන ප්‍රධාන චරිතය වන්නේ පත්තිනි දේවියයි. මේ සඳහා භාවිත කරන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ යක් බෙරයයි. ප්‍රධාන ශාන්තිකර්මය වශයෙන් දෙවොල්මඩු ශාන්තිකර්මය හඳුන්වනු ලැබේ. මෙහි එන සෑම නර්තන අංගයක් ම එකිනෙකට ඉඳුරාම වෙනස් වන අතර නර්තන ශිල්පියාගේ රංග වස්ත්‍රාභරණ වාදනය කවිය ගායනා සියල්ලම විවිධත්වයකින් යුක්ත වේ. එම නිසා ප්‍රේක්ෂකයන් හට ඒකාකාරීත්වයකින් තොර නර්තන වින්‍යාසයක් දැක බලා ගැනීමට හැකි වේ.

පහතරට නර්තනය හුදෙක් මුහුදුබඩ ප්‍රදේශ වන්නට ව්‍යාප්ත වී තිබූ හෙයින් වරින් වර ඇති වූ විදේශ ආක්‍රමණයන් හා සංක්‍රමණ වල බලපෑම්ට අනුව විවිධ අංග වෙනස් වීම් වලට භාජනය වී ඇත.

කෝලම් රූකඩ නාඩගම් මේ තුළ විශේෂත්වයක් එක් කරනු ලබයි. අනෙකුත් සම්ප්‍රදායන්හි දැකිය නොහැකි සුවිශේෂත්වයක් වෙස් මුහුණු පැලඳ සිදු කරන නර්තනය නිසා මීට එක් කරයි. පැරණි පරම්පරාවන්ගෙන් පැවත එන පහත නර්තන ශිල්පීන් හා ප්‍රාදේශීය විෂමතා මත් පහතරට නැටුම් අන්තර්ගතය මාතර, බෙන්තර, රයිගම වශයෙන් ශෛලීන් ත්‍රිත්වයක් හඳුනාගත හැකිය. (කෝට්ටේගොඩ,1996(vii).

## සංචාරක කර්මාන්තය හා නර්තනය

### ලෝක සංචාරක කර්මාන්තය තුළ නර්තනය

අතීතයේ සිට කර්මාන්තයක් ලෙස සංචරණයේ වර්ධනය සිදුවීම්මේ දී කලින් කලට  නිර්මාණය වුණු සංචාරක නිෂ්පාදිත භාණ්ඩ රැසකි. ඉන් ප්‍රධාන නිෂ්පාදිතයක් ලෙස සංස්කෘතික සංචරණය හැඳින්විය හැක. යම් රටක හෝ ගමනාන්තය පවතින සමාජ, ආර්ථික, දේශපාලනික, ඓතිහාසික පරිසරයේ පදනම් කොට ගෙන එයින් ඔප් නැංවෙන අනන්‍යතාවයන් සංචාරකයන් වෙනුවෙන් සංවිධානාත්මක ඉදිරිපත් කිරීම මෙහිදී සිදු වේ. (නාරංගොඩ,2014,ස,ස,08/25) සංස්කෘතිය ආකර්ෂණීය නිෂ්පාදනයක් ලෙස ඉදිරිපත් කිරීමේ දී එය නස්පර්ශිත (ෂබඡ්බටසඉකැ)හා ස්පර්ශිත (ඕබටසඉකැ) වශයෙන් අපට කොටස් දෙකක් හඳුනාගත හැක. සංස්කෘතිය ලෙස අතීතයේ සිට පරම්පරාගතව පවත්වාගෙන එන ලිඛිත හෝ භෞතික වශයෙන් දැකගත නොහැකි මුඛ පරම්පරාගතව පැමිණෙන යානයක් සේ හැඳින්වේ. නර්තනය ද මෙලෙස මුඛ පරම්පරාගතව පැමිණි යානයක් බැවින් නස්පර්ශිත උරුමය ලෙස සංචාරක කර්මාන්තය තුළද ප්‍රධාන අංගයක් ලෙස යොදාගෙන තිබේ (රංගනාත,2014,ස,ස,08/22).

මේ නිසා නර්තන කලාවන් ගෙන් පරිපූර්ණ බොහෝ රටවල් සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ වෙමින් උරුමයක් ලෙස නර්තනය අලෙවි කරනු ලබයි. ආසියානු කලාපයේ රටවල් වලින් වැඩිමනක් නර්තන කලාවන් ඇති රට වශයෙන් ඉන්දියාව හැඳින්විය හැකිය. මන්ද යත් එහි පවතින සෑම ප්‍රාන්තයකම අනන්‍යතාව පිළිබිඹු වන සේ නිර්මාණය වූ එක් නර්තන කලාවක් හෝ අනිවාර්යයෙන් ම දැක ගත හැකි වීමයි. අනෙක් කරුන නම් ඉන්දීය සමාජය තුළ ඉපදෙන සෑම දරුවෙකුම කුඩා කල සිට නර්තනයේ මූලික අධ්‍යාපනය සඳහා යොමු වේ. මේ නිසා

ඉන්දියානුවෙකුටම නර්තන හැකියාව නිතැතින්ම පිහිටා තිබේ. එහෙයින් ඉන්දියාව නර්තන කලාවන් ගෙන් පෝෂණය වූ රටක් ලෙස හඳුනාගත හැකිය. මේ සඳහා නිදසුනක් ලෙස ඉන්දියාව තුළ වේශ නිරූපණය අතින් ඉතාම ඉහළ තලයකට " *කථකලී"* නර්තන කලාව දක්ෂිණ භාරතයේ ප්‍රධාන ශාස්ත්‍රීය නර්තනය ලෙස සැලකෙන දේවදාසියන් විසින් නර්තනයේ යෙදෙන *"භරත"* නර්තන කලාවද භාව ප්‍රකාශය හා අභිනය අතින් උසස් කේරලයේ "මෝහිණී ආට්ටම්"නර්තන කලාව දකුණු ඉන්දියාවේ දුපත් ජනතාව අතර ප්‍රචලිත "ඔට්ටන් නර්තන කලාව" ද උතුරු ඉන්දීය ශාස්ත්‍රීය නර්තන කලාවට ආලෝකකරණයන් වූ "කථක් නර්තන කලාව" හා උත්තර භාරතීය ශාස්ත්‍රීය නැටුම් විශේෂයක් වශයෙන් "මණිපුරී නර්තන කලාව" ද ප්‍රධාන නර්තන කලාවන් කිහිපයක් ලෙස පෙන්වාදිය හැක.(දිසානායක,1994:102-115) මේ නිසා ඉන්දියාව තම රටේ සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාමේදී රටේ අනන්‍යතාවය විදහා දක්වන්නක් ලෙස නර්තනය බොහෝ අවස්ථාවල යොදා ගෙන ඇත.රට වෙත පැමිණෙන ඕනෑම සංචාරකයෙකුට ඔවුන්ගේ සංචාරය තුළදී කිසිවෙකු නර්තනය පහස විඳීමට අවස්ථාව ලබා දෙන අතර සංචාරකයන් ආකර්ශනය කර ගැනීම සඳහා බොහෝ ප්‍රවර්ධන කාරයයන් වලට නර්තනය යොදාගනු ලබයි. නිදසුන් ලෙස 2013 24 දින නිකුත් කරනු ලැබූ සංචාරක ප්‍රවර්ධන වීඩියෝ පටයේ ඉන්දීය භරත නර්තනය යොදා ගෙන ඇත. 2011 පෙබරවාරි 17 නිකුත් කළ වීඩියෝ පටයේ *කථකලි නැටුම්, පන්ජාබි නැටුම්, කෝලට්ටම් නැටුම්, කලපරියාට්ටම්* ආදී සාම්ප්‍රදායික ශාස්ත්‍රීය නර්තන අංග හා ජන නැටුම් රැසක් අන්තර්ගත කර ඇත. (අඅඅගහදමඑමඉැගජදප 2014) සංචාරක කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් ඉන්දියාව තම නර්තනය යොදා ගත්තද එය කිසිදු වෙනස් කිරීමකට ලක් කිරීමක් දැකගත හැකි නොවේ. වේශ නිරූපණය සඳහා පැය 4-5 පමණ වේලා ගත වන කථකලි නර්තනය පවා ඔවුන් කිසිදු අඩුපාඩුවකින් තොරව සංචාරකයා වෙත ඉදිරිපත් කිරීම සිදුකරයි. මනිපූරි,කථකලී,භරත ආදී සෑම නර්තනයක ඉතා විශාල රංග වස්ත්‍රාභරණ ප්‍රමාණයක් පැවතියත් සෑම විටම ඔවුන් දෙවියන්ට ගරු කරන්නාක් මෙන් නර්තනය අනන්‍යතාවය රකිමින් ඒවා නිසි ලෙස පැලදීම සිදු කරයි. එම නිසා සංචාරකයන් විශ්වාසයකින් යුතුව නර්තනය රසවිඳීමට පුරුදුව ඇත. ශාස්ත්‍රීය ලෙස ඉතිහාසයේ සිටම පැවත එන නර්තනයන් වෙත අදාළ වූ සංගීතයක් අද ඔවුනට විසින් ඒවා ආරක්ෂා කරගනිමින් ඉදිරියට යාමට ඔවුන් පෙලඹී ඇත.

සමාජ ජීවිතයෙත් ආගමික ජීවිතයේත් කලාවේත් වෙනසක් දැකිය නොහැකි එකිනෙකට සම්බන්ධ වී ඇති බලි නැටුම් සංචාරක ක්ෂේත්‍රයෙහි ආකර්ශනීය අංගයක් ලෙස සැලකිය හැකි වේ. බාලි ගොවියා රියදුරා, ඇඳුම් මසන්නා, අති දක්ෂ සංගීතඥයෙක් හෝ විකාර වෘත්තියක නියැලී අයෙකු වුවද නැට්ටුවෙකු ද විය හැකි ය. සත්‍ය වශයෙන්ම බාලිවල නැටුම ජනතාවගේ කලා අංගයකි විස්මයට පත් කරවන වර්ගයේ නැටුම් බාලි නැටුම් අතර වේ. බාලි නැටුම් ප්‍රධාන වශයෙන් සටන් මූලික කොට ගනිමින් හා අභිචාර රටාව පදනම් කර ගනිමින් නිර්මාණය වී ඇත. බාලිහි සංචාරකයින් පිනවීමට සංචාරකයන් ආකර්ශනය කර ගැනීමටත් යොදා ගන්නා නර්තන අංග අතර බාලිවල ඉතාමත් තරුණ ගැහැණු ළමයින් තිදෙනකු රඟදක්වන මනහර නැටුමක් වන *"ලොගොන්ග්"* කලාවද විදේශික සංචාරකයන් බාලි දිවයින වඳුරු නැටුම් යනුවෙන් හඳුන්වනු ලබන කෙට්ජැක් (Ketjak) නැටුම් ද මිත්‍යා

පුරාවෘත්තයනට අනුව සිංහයෙකුගේ භාවලීලා හුවාදක්වන "*බාරොන්ග් නර්තනයද*", "*ගබෝර් නැටුම්*" ද ප්‍රධාන වේ. නිදසුන් ලෙස 2011. 10. 23 දින නිකුත් කරන ලද සංචාරක ප්‍රවර්ධන වීඩියෝ පටය ඔවුන් තම ලොකු නර්තනය භාරය ආදිය තත්ත්ව අනුසාරයෙන්ම අන්තර්ගත කොට තිබේ. 2010. 03. 19 සංචාරක මණ්ඩලය නිකුත් කරන ලද ප්‍රවර්ධන විඩියෝවේ ද සංචාරකයන් වෙත ඉදිරිපත් කරන ලද අත් පත්‍රිකාවලද සෑම විටම නර්තන අංගයන්ගේ රූප රාමු චිත්‍රණය කර ඇත. (www.youtube.com 2014)

එමෙන්ම පැමිණෙන ඕනෑම සංචාරකයෙකු හට බාලි නර්තනයේ මිහිරියාව විඳ ගැනීම සඳහා ඔඉමා ඍදන්ක ඡක්ජු නර්තන ශාලාව ඉදි කරවා එහි නිරතුරු නර්තන ප්‍රබන්ධ පැමිණෙන්නන් හට ඉදිරිපත් කරයි. (රංගනාත,2014,ස,ස,08/22) මේ ආකාරයට සංචාරක කර්මාන්තය සමග නර්තනයේ ඒකාබද්ධ වී සිටියද කිසිවිටෙකත් ඔහු නැටුමට හානියක් ගෙනදෙන අයුරින් කටයුතු කිරීම්ක් දැකගත හැකි නොවේ. ඒකාකාරී බව වැඩි, එක දිගට නැරඹීමටට නොහැකි වුවද ඔවුන් කිසිදු නව්‍යකරණයකින් තොරව පෞරාණික හා ශාස්ත්‍රීය බව දකිමින් සංචාරකයන් වෙත ඉදිරිපත් කරයි. සංචාරකයාගේ අප්‍රසාදයට ලක්වන හේතුවක් වුවත් සත්‍යතාවය අගය කරන පිරිස තව තවත් ඒ කෙරෙහි බැඳීමක් ඇති වේ.

ලෝක සංචාරක කර්මාන්තය තුළ නර්තනය සඳහා ප්‍රධාන තැනක් දෙමින් කටයුතු කරන අප්‍රිකානු රටවල් බොහෝ සෙයින් තම ගෝත්‍රික නර්තනයන් වෙත අවධානය යොමුකර ඇත. නයිජීරියාව, බටහිර අප්‍රිකානු රටවල වැඩිනමනක් ප්‍රචලිත Yabara නර්තනය කලාව ද අවමංගල් උත්සවවලදී වැඩිමනක් භාවිතා කරන Agbekor නර්තනය ද මසායි ගෝත්‍රිකයින්ගේ සාම්ප්‍රදායික යුධමය අවස්ථා තේමා කොට ගනිමින් නිර්මාණය කර ඇති Adumu නර්තනය ද අප්‍රිකාවේ බෙර නර්තනය නමින් ප්‍රචලිත වූ අප්‍රිකානු දේශීය ජනතාවගේ ජන නැටුම් විශේෂයක් වන Kpanlogo නර්තන කලාවන් ද සුලු ගෝත්‍රිකයන්ගේ මංගල අවස්ථාවල දී යොදා ගන්නා Indlamu නර්තනයන් ද ඒ අතර ප්‍රධාන වේ. ඔවුන් මේ නර්තන කලාවන් වර්තමානය වන විට මදක් නවීකරනයට භාජනය කොට ඇත.(www.buzzle.com 2014) මන්ද යත් අතීතයේ වන ගෝත්‍රික ජනතාව යොදා ගත්තේ වනය තුළින් ලබාගත් මෙවලම්ය. සතුන්ගේ හම්වලින් සැදූ ඇඳුම්ද සත්ත්ව අස්ථි වලින් තනාගත් භාණ්ඩ ද වෙනුවට කෘතිම දෑ වෙත අවධානය යොමු කොට ඇත. නිදසුන් ලෙස සත්ත්ව හම් භාවිතයෙන් ඇඳුම් පැළඳුම් නිර්මාණය කරගත් ඔවුහු වර්තමානයේ දී රෙදි වලින් නිමවුනු ඇඳුම් භාවිතා කරති. එමෙන්ම පෙර නර්තනයටද අතීතයේ යොදා ගත්තේ සත්ත්ව සම් භාවිතයෙන් ඔවුන් විසින් සදාගත් සාම්ප්‍රදායික බෙර වර්ගයකි. එහෙත් වර්තමානයේ වෙළෙඳ පොළෙන් ලබාගන්නා කෘතිම යහාමු සහිතව බෙර භාවිතයට ඔවුන් පෙලඹී ඇත. එහෙත් ඔවුන් සංචාරක කර්මාන්තයට තම ගෝත්‍රික නැටුම් යොදා ගැනීමේදී එය ගැටලුවක් කොටගෙන නැත. ඒ පිළිබඳ වැඩි අවධානයකින් තොරව තම රටේ පවතින අනෙක් සංචාරක ආකර්ෂණයන් ද සමග නර්තනය ද ඒකාබද්ධ කොට සංචාරකයාට ඉහල අත්දැකීමක් ලබාදෙමින් සිටිති. 2014.05.22 නිකුත් කළ සංචාරක ප්‍රවර්ධන වීඩියෝ පටවල අප්‍රිකානු ගෝත්‍රික නැටුම් සෑම එකක්ම අන්තර් ගත කොට ඇති අතර එහිදී නර්තනයට නවීකරණයන් එක්

කොට නැතත් ඇඳුම් පැළඳුම් සහ භාවිතා කරන මෙවලම්හි වෙනසක් දැක ගත හැක. (www.youtube.com 2014)

මීට අමතරව තවත් බොහෝ රටවල් තමන්ට ආවේණික වූ නර්තන කලාවන් සංචාරක කර්මාන්තයේ විවිධ අවශ්‍යතා උදෙසා යොදා ගනී. ජපානයේ "*කබුකි*" නර්තනය එම රටේ *Yokohoma* නම් සංචාරක මණ්ඩලය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශන පොතෙහි ඉතා විචිත්‍ර ලෙස අන්තර් ගත කොට ඇත. නේපාලයේ සාම්ප්‍රදායික වෙස් මුහුණු හා රූකඩ නර්තනය *Shopping in Nepol* නම් එරට සංචාරක මණ්ඩලය විසින් නිකුත් කරන ලද සංචාරක මාර්ග මාර්ගෝපදේශන පොතේ දක්වා ඇත. ගන්ග්ඩොන් හි *Festival tour* නම් එරට සංචාරක මණ්ඩලය විසින් නිකුත් කළ අත් පොතේ සෑම තේමාවක් සඳහාම නර්තන අංග ඉදිරිපත් කර ආකර්ෂණීය බව උද්දීපනය කර ඇත. භූතානයේ ආවේණික *"කොටි නැටුම"* ශ්‍රී ලංකාවේ "උඩරට නැටුම්" ඒ අතරින් ප්‍රධාන තැනක් ගනී. හවායිහි *Insight Guide* නම් 1992 ඒ.පී.ඒ ප්‍රකාශකයන් විසින් නිකුත් කළ සංචාරක අත්පොතෙහි ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ මුහුදු ආශ්‍රිතව සිදුකරන "*හවායි*" නර්තනයේ ඉතිහාසයේ පටන්ම රූප රාමු ද සහිතව කරුණු ඉදිරිපත් කර ඇත. මේ ආකාරයට රටවල් තම නර්තන සම්ප්‍රදායන් පිළිබඳ සංචාරකයන් දැනුවත් කිරීමටත් සංචාරකයන් තම රට වෙත ආකර්ශනය කර ගැනීමටත් නර්තනය යොදා ගන්නවා පමණක් නොව රට තුළ දී සතුටු කිරීමටත් නර්තනය යොදා ගනී. නිදසුනක් ලෙස ඉන්දියාවේ සංචාරය කරන්නෙකු අනිවාර්යයෙන්ම ඉන්දීය නර්තනයක පහස ලැබීම සිදු වේ. මන්ද යත් එම රට තුළ සෑම කටයුත්තකටම ප්‍රධාන වන නිසාවෙනි . එමෙන්ම ජපානයට සංචාරය කරන්නෙකුට කබුකි, නෝ ආදී කලාවේ රසය ලබාදීමට ඔවුන් අමතක නොකරති (නාරංගොඩ,2014,ස,ස,08/25).

සංචාරක කර්මාන්තය තුළ නර්තනය යොදා ගන්නා තවත් ආකාරයක් නම් නර්තන උත්සව, නර්තන ප්‍රසංග, නර්තන තරගාවලි, නර්තනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීමයි. මේ හරහා එම අවස්ථාවලට සහභාගී වීමට පිරිස් තම රටවල් වෙත ආකර්ෂණය කර ගැනීම්ටත්, ජාත්‍යන්තර මට්ටමෙන් නර්තන විවිධ අවස්ථා දැක බලාගැනීමට සංචාරකයන් ගෙන්වාගැනීම සිදු වේ. මේ වක්‍රාකාරයෙන් නර්තනය හරහා සංචාරකයන් ආකර්ශනය කර ගැනීමේ ක්‍රියා ක්‍රියාවලියක් වේ. මේ අවස්ථාවන් වලට නිදසුනක් වශයෙන් Cheonen World Festival, ඉන්දියාවේ Delhi Dance Festival, ජපානයේ Tokyo Dance Festival, ඇමරිකාවේ Chicago Annual Dance festival, I.D.O European Championships, ඉන්දුනීසියාවේ Art Festival පෙන්වා දිය හැකිය. (රංගනාත,2014,i,i,08/22)

නර්තනයේ සංස්කෘතික සංචරණය සඳහා ප්‍රධාන වුවද වර්තමානයේ අනෙකුත් සංචාරක නිෂ්පාදිත කාණ්ඩ තුළ ද අන්තර්ගත කොට ගෙන ඇති බව දැකගත හැක. එනම් විදෙස් සංචරණය තිරසාර ලෙස පවත්වාගෙන යාමේදී අදාල ගමනාන්තවල සිටින ප්‍රජාව ඊට සහභාගී කර ගැනීමයි. එහිදී යම් සංචාරක ආකර්ෂණයක් සංචාරකයන් වෙත පිළිගැන්වීමේ දී එහි පවතින කලාවන් හා සංස්කෘතික අනන්‍යතාවයන් අදාළ ප්‍රදේශයේ වෙසෙන ජනතාව හරහා සංචාරකයන් වෙත ලබා දීම සිදු වේ. මේ තුළ නර්තන කලාවන් සංචාරකයන් වෙත ඉදිරිපත් කිරීම

බොහෝ විට සිදුවේ. නිදසුන් ලෙස බාලි හි ග්‍රාමීය සංචරණය සිදු කරන පිරිස් වෙත එහි සම්ප්‍රදායික "*වක්කා නර්තනය*" රස විඳීමට අවිදීමට අවස්ථාව ලබා දේ. ඒ හරහා නර්තනය ශිල්පීන්ටත් සංචාරක නර්තනයේදී සුරක්ෂිත භාවය ද රැකී ඇත (www.indonesia travel.com:2010).

වර්තමාන ප්‍රවණතාවයක් ලෙස ලිංගික සංචරණය සඳහා ද නර්තනය යොදා ගෙන ඇති බව හඳුනාගත හැක. ලිංගික කටයුතු සඳහා පිරිසක් ආකර්ෂණය කර ගැනීමේ නව ක්‍රමවේදයක් ලෙස ආලිංගන නර්තන ආකාරයෙන් නැටුම භාවිතා කරයි. ලිංගික සංචරණය සඳහා වඩාත් ප්‍රකට රටක් වන තායිලන්තයේ පත්තායා වෙරළාශ්‍රිතව බොහෝ සෙයින් කාන්තාවන්ගේ නග්න රූප නිරූපනය වන නර්තනය දැකගත හැක. හවායිහි හොනලුලු ආශ්‍රිතව ද මේ ක්‍රියාවලිය සිදුවේ. ඕස්ට්‍රේලියාවේ රියෝ ප්‍රසංගය හරහාද කාන්තාවන්ගේ නග්න සිරුර නර්තනය උපයෝගී කර ගනිමින් චලන මාර්ගයෙන් ලිංගිකත්වය මතුකර දක්වයි. මෙලෙසින් නර්තනය ලිංගික සංචරණය සඳහා යොදා ගන්නා මෙවලමක් ලෙස ද හඳුනාගත හැක (නාරංගොඩ,2014,ස,ස,08/25).

මෙලෙස සංචාරක කර්මාන්තය තුළ නර්තනය ආකර්ෂණයක් ලෙස පවතින ආකාරය දෙස අවධානය යොමු කිරීමේ දී එය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් පවතින බව හඳුනා ගත හැක.

1. සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සංකේතයක් ලෙසින්,
2. සංචාරක නිෂ්පාදිත අංගයක් ලෙසින් වේ.

මෙයින් පසක් වන්නේ සංචාරක ව්‍යාපාරය හා නර්තනය අන්‍යොන්‍ය වශයෙන් බැඳී කටයුතු කරන අතර සැම විටම ව්‍යාපාරයේ උන්නතිය උදෙසා නර්තනය ආකර්ශනයක් ලෙස මහත් කාර්යභාරයක් ඉටුකරන බවයි.

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ නර්තනය**

ශ්‍රී ලංකාව තුළ ද අන් කිසිදු රටක දැකගත නොහැකි අන්දමින් නර්තන සම්ප්‍රදායන් ගොන්නක් දැකගත හැකිය. ඒ අතර ශාස්ත්‍රීය නර්තනය ලෙස උඩරට, පහතරට, සබරගමු නර්තන ද සරල ගැමි නර්තනය ද විශේෂත්වයක් ගනී. එමෙන්ම උඩරට වෙස් නර්තනය, පහතරට වෙස් මුහුණු නර්තනයන් නිසාවෙන් ලෝකය පුරා බොහෝ සංචාරකයන් ලංකාව කෙරෙහි යම් අවබෝධයකින් සිටිනු දැකගත හැක. (නාරංගොඩ,2014,ස,ස,08/25) විශේෂයෙන් ශ්‍රී ලංකාවේ යැයි ඇසූ පමණින් ලොව ම කෙනෙකු මවා ගනු ලබන්නේ ලබන චිත්‍රයේ මහනුවර ඇසළ පෙරහැර ප්‍රධානත්වයක් ගනී. උඩරට නර්තන කලාවේ මහා මංගල්‍යය ඇසළ පෙරහැර නැරඹීමට දෙස් විදෙස් බොහෝ සංචාරකයන් ලංකාවට පැමිණේ. ඇසළ පෙරහැර හැරුණුකොට කොළඹ ගංගාරාම පෙරහැර, මහියංගන පෙරහැර, කැලණි පෙරහැර, සමන් දේවාල පෙරහැර, තිස්සමහාරාම පෙරහැර, ආදිය සංචාරකයන්ගේ ආකර්ෂණය හිමි නර්තන මංගල්‍යයන් ලෙස ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රය තුළ හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලාංකීය සංචාරක කර්මාන්තය තුළ ද නර්තනය යොදා ගැනීමේ දී ඉහත සඳහන් කළ ආකාරයටම ක්‍රම දෙකක් වේ. එනම් සංචාරක නිෂ්පාදිතයක් ලෙස හා ප්‍රවර්ධනය සිදු කිරීමේ මාධ්‍යයක් ලෙස වේ. නර්තනය වනාහි සංචාරකයෙකුට ඉතා හොඳ අත්දැකීමක් ලබා දිය හැකි ආකාරයකි. ඒ අනුව මේ වනවිට සංචාරකයින්

වෙනුවෙන් ක්‍රියාත්මක කරන Eight wonders in eight days යන සංකල්පය යටතේ පුදුම අටෙන් එක් පුදුමයක් ලෙස Essens තේමාව තුළ ප්‍රධාන අංගයක් ලෙස නර්තනය යොදා ගෙන ඇත. එමගින් සංචාරකයන්ට ලංකාවේ විවිධ නර්තනයන් සමඟ සමීප අත්දැකීම් ලබා දී ඇත. (www.sltda.lk:2014)

එලෙසම සංචාරකයන් උදෙසා ම සංචාරක නිෂ්පාදිතයක් ලෙස සංස්කෘතික නර්තන ප්‍රසංගද ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පැවැත්වේ. ඒවා නුවර නගරය ආශ්‍රිත කොටගෙන දැකගත හැක. හෝටල් ආශ්‍රය කොටගෙන පවත්වන නර්තන ප්‍රසංග මෙන්ම දිනපතා සංස්කෘතික නර්තන ප්‍රසංග සංචාරකයන් උදෙසා පවත්වන ස්ථාන ද බොහොමයක් ලෙස නුවර ලේක් ක්ලබ් හිදී පවත්වන සංස්කෘතික ප්‍රසංග තරුණ බෞද්ධ ශාලාවේ මල්ලවආරච්චි සංස්තෘතික ප්‍රසංගය, නුවර මධ්‍යම සංස්කෘතික ශාලාවේ හා රතු කුරුස ශාලාවේ පවත්වනු සම්ප්‍රදායික උඩරට හා පහතරට නර්තන ප්‍රසංග හඳුන්වා දිය හැක. මේ සෑම ස්ථානයකම සංචාරකයන් වෙනුවෙන් ශාස්ත්‍රීය මෙන්ම ගැමි ජන නැටුම ද අන්තර්ගත කර ඇත. (සෙනෙවිරත්න, 2014,ස.සා,09/05)

මීට අමතරව බොහෝ සංචාරක හෝටල් විවිධ අවස්ථාවන් උදෙසා නර්තනය යොදා ගැනීම ද සිදුවේ. සංචාරකයන් හෝටලය වෙතට පැමිණීමේ දී ඔවුන් පිළිගැනීමේ පටන් ඔවුනට අවශ්‍ය සෑමවිටම නැටුම යොදා ගැනීම සිදුකරයි. එමෙන්ම සතිපතා සංචාරකයන් වෙනුවෙන් නර්තන ප්‍රසංග ඉදිරිපත් කිරීමත් නර්තනය තේමා කොටගත් රාත්‍රීන් සංචාරකයන් වෙනුවෙන් ලබා දීමත් හෝටල් හිමියන් විසින් වර්තමානයේ සිදුකෙරෙන සුලබ කාර්යයකි. විශේෂයෙන් නව අවුරුදු උදාවත්, දෙසැම්බර් 31 දිනයත් පදනම් කොට ගනිමින් සංචාරකයන් සමඟ අදාළ උත්සව නර්තනය ද මුසු කරගනිමින් සැමරීම සිදු කරයි. එමෙන්ම වර්තමානයේ සංචාරක කර්මාන්තය තුළ පවතින විශේෂතම සිදුවීමක් වන්නේ සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණ ඔවුන්ගේ විවාහ මංගල්‍යයන් සැමරීමයි. එහිදී උත්සව සංවිධානය කරන්නන් ඔවුන්ගේ උත්සව අවස්ථාවන් වර්ණවත් කිරීමටත් පුදුම කරවීමටත් නර්තනයේ විශේෂ අංග එක් කර ගනිති (නාරංගොඩ,2014,ස,ස,08/25).

නිෂ්පාදිතතයක් ලෙස පමණක් නොව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන මාධ්‍යයක් ලෙස ද නර්තනය යොදා ගැනීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව තුල පමණක් නොව අන්තර්ජාතික මට්ටමින් සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමේ දී ප්‍රධාන තැනක් නර්තන වෙත ලැබී ඇත. 2013 ජූලි මස Mega Tourisum Road Show සමගාමීව පැවති Mega Tourisum Caravan හිදී සාම්ප්‍රදායික නර්තනය යොදා ගෙන ඇත. මේ ආකාරයට ම ශ්‍රී ලංකාව තුළ සංචාරන ප්‍රවර්ධන සිදුකරන සංස්කෘතික ප්‍රසංග, වැඩමුළු, සාකච්ඡා, ප්‍රදර්ශනවලදී අනිවාර්ය අංගයක් ලෙස නර්තනය දැකගත හැක. (weerathunga,2013:03)

නිදසුනක් ලෙස යුක්රේනයේ පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක දී ශ්‍රී ලංකාව සාම්ප්‍රදායික නර්තනාංග හයක් ඉදිරිපත් කර ඇත.(www.News.lk:2013) ඉන්දියාවේ දිල්ලි හා මුම්බායි හිදී Get Sri Lankan සංකල්පය යටතේ පැවැත්වුණු ප්‍රවර්ධන වැඩ වැඩසටහනේදී ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික නර්තනය ප්‍රධාන චරිතයක් මෙහෙයවන ලදී. (www.Media.Government.lk:2014) එමෙන්ම 2013 චීනයේ

බීජිං නුවර පැවති ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහනේදී ලාංකීය සම්ප්‍රදායික නර්තන කණ්ඩායමක් ද සහභාගී වී ඇත.

තවද ශ්‍රී ලාංකීය නර්තන අංග ඉදිරිපත් කරන පින්තූර හා රූප රාමු විශාල ප්‍රමාණයක් වෙබ් අඩවි, අත්පත්‍රිකා, පෝස්ටර්, විද්‍යුත් සඟරා, බස් රථ හා ටැක්සි රථවල ප්‍රදර්ශනය කර ඇත. ටැක්සි රථවල ප්‍රචාරනය එක්සත් රාජධානිය මුල්කොටගෙනත්, බස්රථවල ප්‍රචාරනය චීනයේ මුල්කොටගෙනත්, වැඩි වශයෙන් දැක්ගත හැකි අතර ඉන් බහුතරයක් නර්තනය හා සම්බන්ධ රූපරාමු වලින් යුක්ත වේ.(www.skyarper city.com:2014)

ශ්‍රී ලංකාවේ කුමන ආකාරයේ නර්තන කලාවන් සංචාරක කර්මාන්තය හා මුසු කළ ද ඒ සෑම විටම පැරණි ශාස්ත්‍රීය ක්‍රම ශිල්ප හා සම්ප්‍රදායික බව රැකෙන අයුරින් නොවන බව නිරූපනය වේ. ලෝකයේ බොහෝ රටවල් තම අනන්‍යතාව රැකෙන ලෙස නර්තනය ලෝකය වෙත ඉදිරිපත් කිරීමේදී එහි සාම්ප්‍රදායික බව සහ සත්‍යතාව යන කාරණාවලට කිසිදු හානියක් නොක ිරීමට වග බලාගිනිති. එහෙත් ශ්‍රී ලාංකේය නර්තනය බෙහෙවින් නව්‍යකරණයට ලක්කර ඇති බව පෙනේ. නිදසුක් ලෙස උඩරට වෙස් නැටුම් ඉදිරිපත් කිරීමේදී සෑම විටම පිනුම්, කැරකිලි, වේගවත් ලයකට නැටීම ආදිය ඉදිරිපත් නොවේ. එහෙත් සංචාරකයන්ගේ ආකර්ෂණය තව තවත් ලබාගැනීම සඳහා ඔවුන් එම දෑ නර්තන අංගය පුරාම ඉදිරිපත් කිරීමට පෙලඹී ඇත. තවද ශාන්තිකර්මය තුළ අන්තර්ගත නර්තන අංග ඉතාමත් සංකීර්ණ හා පැය දෙකක් පමණ කාල වේලාවක් එකම අංගය නටනු ලබයි. උදාහරණ ලෙස ආවැන්දුම, බුලත් පදය, තෙල්මේ, දෙවොල්, යක් ඇන්නුම පෙන්වාදිය හැක. එහෙත් මෙම අංග සංචාරකයා ඉදිරියේ ඉතාමත් සංක්ෂිප්ත කොට එහි අන්තර්ගතය පිළිබඳ සැලකීමකින් තොරව ආකර්ශනීය අංග එක් කොට ඉදිරිපත් කරනු ලබයි. කවි ගායනා පවා නිවැරැදි තාල රටාවන්ගෙන් නොව වර්තමානයේ ජනප්‍රිය සිංදුවල තාල රටාවන්ට සමානව ගායනා කරමින් නර්තනයේ යෙදෙනු දැකගත හැකිය. නර්තනය පමණක් නොව නර්තනයට භාවිතා කරන වස්ත්‍රාභරණ, වෙස් මුහුණු ආදිය ද වෙනස් කිරීම්වලට ලක් කිරීමත් වර්තමානයේ සිදු වේ.(නාරංගොඩ,2014,ස,ස,08/25)

එමෙන්ම ලාංකේය සමාජය තුළින් සංචාරකයා වෙත නර්තනයෙහි බොහෝ දේ ලබා දීමේදී නව ප්‍රවණතාවක් ලෙස අනික් රටවල නර්තනාංග ද ඊට මුසු කිරීම දැකගත හැක. උදාහරණ ලෙස දකුණු ලක වෙරළ බඩ හෝටල් සියල්ලකම පාහේ දෙස් විදෙස් සංචාරකයන් වෙනුවෙන් පවත්වන නර්තන ප්‍රසංග වලදී ඉන්දීය නර්තනයන්, චීන නර්තනයන්, ඉදිරිපත් කිරීමට පෙළඹී ඇත. මෙය විදේශීය සංචාරකයකුට ශ්‍රී ලාංකීය නර්තන කලාව කුමක් ද යන්න නිවැරදිව තේරුම් ගැනීමට අපපහසුවක් වන අතර එකම රටකදී විවිධ නර්තන කලාවන් රැසක් දැක බලා ගැනීමේ අවස්ථාවක් ද වනු ඇත. (මීගහවත්ත,2014,ස,ස,09/12)

මේ සෑම දෙයක්ම සංසන්දනාත්මකව බලන කල් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ නර්තන කලාව යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ අදහස් උභතෝකෝටිකයකි. මන්දයත් එය වරෙක සංචාරකයාගේ අවශ්‍යතාවයක් මත වර්තමානයට උචිත ලෙස සිදුවන වෙනස්වීමක් වන බැවින් සංචාරක ආකර්ශනය වැඩි වීමක් සිදුවිය හැක. එහෙත් ශ්‍රී ලාංකීය නර්තන කලාවේ යථානුභූතීභාවයට සිදු වන හානිය නිසාවෙන් දේශීය හෝ විදේශීය සංචාරකයා සංචාරක කර්මාන්තය තුළින්

ලබාදෙන මේ නර්තනයේ අත්දැකීම ලබා ගැනීමට නැඹුරු වේ ද යන්න සැක සහිතය
.

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ පහතරට නර්තනය**

ශ්‍රී ලංකාවේ දකුණු පළාත ප්‍රමුඛ පහතරට ප්‍රදේශය මුල් කරගනිමින් මෙම පහතරට නර්තන කලාව සම්භවය වී ඇත. හෘද ස්පන්දනයට ආමන්ත්‍රණය කරන්නා වූ හා ඊට සමාන සමාන රිද්මයකින් වැයෙතැයි ව්‍යවහාරයේ පවතින පහතරට බෙරයේ නාදයට අනුව ඉදිරිපත් කෙරෙන පහතරට නර්තනයේ විචිත්‍රත්වය හා විවිධත්වය නිසාම දේශීය විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයට පාත්‍ර වී ඇත. මේ නිසාම සංචාරක කර්මාන්තය තුළ ආකර්ෂණීය බව වැඩිදියුණු කිරීම සඳහා වැඩි වශයෙන් පහතරට නර්තන අංග ලෙස යොදා ගැනීමට පුරුදුව ඇත (රංගනාත,2014,ස,ස,08/22). එමෙන්ම සංචාරක කර්මාන්තය තුළ දී සංචාරකයාගේ රසවින්දනය උදෙසා බොහෝ අවස්ථාවලදී පහතරට නර්තනය ප්‍රදර්ශන මෙවලමක් ලෙස රැගෙන යාම සිදු කරනු ලබයි. මෙහිදී සංචාරක කර්මාන්තය උදෙසාම නර්තනය නොපැවැත්වුවද ඒවා වක්‍රාකාරයෙන් සංචාරක කර්මාන්තය නගා සිටුවීමට දායක වේ. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ පෙරහැර පද්ධතිය හා ශාන්තිකර්ම පද්ධතිය පෙන්වාදිය හැක. ගංගාරාම පෙරහැර, කැළණිය රජ මහා විහාර පෙරහැර, කතරගම දේවාල පෙරහැර ආදියේ දී විශේෂයෙන් පහතරට නැටුම සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. පහතරට ශාන්තිකර්ම වන දෙවොල් මඩු, ගම් මඩු, දහඅට සන්නි, රිද්දි යාගය ආදීය පහතරට ප්‍රදේශවල පහතරට නැටුම ප්‍රමුඛ කර ගනිමින් පූජාර්ථය පෙරදැරි කොටගෙන නිරතුරුවම සෙත්පතා පැවැත්වේ. මේ නිසා සංචාරකයාගේ අවශ්‍යතාව පරිදි පහතරට නැටුම් යථානුභූති භාවයෙන් යුතුව දැක ගැනීමටද හැකියාව පවතී. මෙහිදී පැන නගින එකම ගැටලුව නම් පැවැත්වීමේ ස්ථිර දිනයක් නොමැති වීමත් දිනපතා නොපැවැත්වීමත් එක් කාලසීමාවකට පමණක් සීමා වීමත් ය.

එමෙන් ම සංචාරකයාගේ රසවින්දනය උදෙසා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් පවත්වන නර්තන ප්‍රසංගද බොහෝය. අලුත්ගම ඊඩ්න් හෝටලය, බෙන්තොට අවානි හෝටලය, බෙන්තොට බීච් හෝටලය, ක්ලබ් බෙන්තොට හෝටලය, මෙලෙස සංචාරකයන් පිනවීම සඳහා පහතරට නර්තනය යොදා ගන්නා දකුණු ලක හෝටල් කිහිපයකි. (මීගහවත්ත,2014,ස,සා,09/12) මොවුන් සංචාරකයා ආකර්ශනය කර ගැනීමටත් රඳවා තබා ගැනීමටත් ඉතා හොඳ උපක්‍රමයක් ලෙස නර්තනය හඳුනාගෙන ඇත. ඒ අතරිනුත් සංචාරකයාට සෑම විටම නව අත්දැකීමක් ලබා දීම සඳහා පහතරට නැටුම් අංග යොදා ගැනීමට ව්‍යාපාරිකයන් සූක්ෂම වී ඇත. සම්ප්‍රදායයෙන් උකහා ගෙන ඇති නර්තන අංග දෙස අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන ආකර්ෂණීය අංග ලෙස තෙල්මේ, දෙවොල්, සළුපාලිය, ගිනි සිසිල, වඩිගපටුන, නාග රාක්ෂ, ගුරුළු රාක්ෂ, පන්දම් පාලිය, ආදිය යොදාගෙන ඇත. මේවායේ විශේෂත්වය නම් එක් එක නර්තනයට භාවිතා කරන රංග වස්ත්‍ර, ගායනය, නර්තනය, වාදනය, සියල්ල එකිනෙකට වෙනස් වීම් හා අලංකාරවත් වීමයි. නිදසුනක් ලෙස තෙල්මේ නැටුමේදී ගායනය රහිතව ඉතාමත් අලංකාර *පබළු ඇඳුම් කට්ටලයෙන්* සැරසෙන නැට්ටුවා පහතරට ජවය ප්‍රකාශ කරන පැනිලි, කැරකිලි, පිනුම්, මාලක්කම්, බඹර වළලු ආදී රංග ශිල්ප උපයෝගී කරගනිමින් තම නිපුණතාව

පෙන්නුම් කරයි. එහෙත් සළුපාලිය ඉදිරිපත් කරන නැට්ටුවා ඉතා සුළු නර්තන උපයෝගී කරගනිමින් වේදිකාවට හාස්‍ය මුසු දෙබස් හා කවි ගායනා ඉදිරිපත් කරමින් නාට්‍යමය ජවනිකාවක් සහිතව නිරූපණ ඉදිරිපත් කරයි. වෙස්මූණක් සහිතව යක්ෂයකුගේ ඇඳුම්ට සමාන ඇඳුම් කට්ටලයකින් සමන්විත වූ වෙනස්ම ආකාරයේ රස වින්දනයක් ගෙන දේ. මෙලෙස පහතරට නැටුම් විශ්මයජනක බව පෙන්වාදිය හැක. ඒ අනුව සංචාරක ආකර්ෂණයට පහතරට නැටුම් පාත්‍රවී ඇත.

මේ ආකාරයට පහතරට නැටුම් ආකර්ෂණයක් ලෙස සංචාරක කර්මාන්තය තුළ ක්‍රියාත්මක වීමේ දී සිදුවී ඇති සාධනීය හා නිශේධනීය ගුණාංග බොහෝ වේ. පහතරට නැටුම් සාම්ප්‍රදායිකව පැවත එන ආකාරයෙන්ම සංචාරක කර්මාන්තයට මේවන විට යොදාගෙන තිබීම දැකිය නො හැක. සාමන්‍යයෙන්ම සෑම නැටුමකටම මෙන්ම පහතරට නැටුමේද නර්තනයේ රංග වින්‍යාසයට විශාල නව්‍යකරණයක් සිදුවී ඇත. සෑම අංගයක්ම වේගවත් ලයකට නැටීම සිදුවෙමින් පවති. බොහෝ විට රුහුණු බෙරයේ තාලයට නොව පටිගත කළ සංගීතයට හෝ ජනප්‍රිය සින්දු භාවිතා කරන නර්තනය විකෘති කර ඇති ආකාරය දැකගත හැක. නමුත් සංචාරකයන් අතුරින් බොහෝ දෙනෙකුට අවශ්‍ය වන්නේ ද එයයි. ඉතා අඩු ලයකට නැටීම මොවුන්ගේ ප්‍රීතියට හේතු නොවේ. වේගවත් ලයකට පිනුම් ගසමින් සිදුකරන ජවය සහිත අංගවලට සංචාරකයින්ගේ අත්පොලසන් නාදය වැඩිවේ. මේ නිසාම නර්තන කලාව ද සංචාරක කර්මාන්තය ගමන් කරන දිශාවට අනුරූප වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ නර්තන කලාවන් අගයන් එහි අගය වටහාගත් අනන්‍යතාවය යථානුභූතිභාවය යන කරුණු වලට මුල්තැන දුන් පිරිස පැමිණියහොත් ඔවුන් ශ්‍රී ලාංකීය නැටුම් කලාව ගැන කණගාටුවට පත් විය හැක. පහතරට නැටුමේ රංග වස්ත්‍රාභරණ පිළිබඳව සංචාරකයා ඉමහත් කැමැත්තක් දක්වයි. මන්දයත් එහි ඇති විචිත්‍රත්වය හා නස්පර්ශිත ගුණය නිසාවෙනි. උදාහරණයක් ලෙස තෙල්මේ ඇඳුම් කට්ටලයට යොදාගෙන ඇති රේඛා හැඩතල රංගන ශිල්පීන්ට හැර සිදු කළ නොහැක. පබලු උපයෝගී කරගනිමින් කරන මෙම කාර්යයට මාස තුනක පමණ කාලයක් වැය වේ.

එක් ඇඳුමක් සඳහා යොදා ගන්නා වෙස් මුහුණුද නිර්මාණයේදී විශාල කාර්ය පටිපාටියක් පවති. නැටුම නැටීම පමණක් නොව මුළු නිර්මාණයේ දී පවතින නස්පර්ශිත උරුමය එහි නර්තනමය වටිනාකම වැඩිවීමට හේතුවකි. කෙසේ වෙතත් රංග වස්ත්‍රාභරණ වල සුළු වෙනස් කම් සිදුවී ඇතත් එය නර්තනයේ අනන්‍යතාවට හානියක් වී නැත. නව නිර්මාණ වශයෙන් බිහිවන වෙස්මුහුණු නිසා නවතම නර්තන අංග ද බිහිවෙමින් පවතී. නිදසුනක් ලෙස මොණර රාක්ෂ නර්තනය හඳුන්වාදිය හැක. විවිධ අවස්ථාවලදී පහත රට නැටුම් ඉන්දියානු නර්තනයේ හැඩහුරුකම් ගැනීමට යාම දුර්වලතාවයකි. මන්ද යත් යොදාගන්නා රංගවස්ත්‍රාභරණ දේව චරිත වලට සමාන වේ. නිදසුන් ලෙස පත්තිනි, ගිරිදේවි වැනි චරිත වල දී ඉන්දියානු ආරක් දිස්වේ. ඊට යොදාගන්නා වාදනයේදී නව්‍යකරණයක් ලෙස රුහුණු බෙරයට අමතරව ඉන්දියානු වාද්‍ය භාණ්ඩ වන මෘදංගය වැනි දෑ වර්තමානයේ දී යොදා ගැනේ. එය අලංකාර වුවත් සංචාරකයන් එය ඉන්දියානු නැටුමක් ලෙස වරදවා වටහා ගැනීම හේතුවක් වී ඇත. එමෙන්ම බොහෝ නර්තන කණ්ඩායම් නර්තනය පිළිබඳව ප්‍රගුණ කිරීමකින් තොරව මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් ක්ෂේත්‍රයට පිවිසි ඇත. ඔවුන්

නිවැරදි අංගහාර ඔස්සේ නර්තන ඉදිරිපත් නොකරයි. ඒ නිසාම ශිල්පීය ගුණයෙන් යුතු ක්ෂේත්‍රයට පිවිසීමට ඇති ඉඩකඩ ඇහිරීම සිදුවේ. නිසි පුහුණුවක් නොමැති පිරිස් නර්තනයේ යෙදීම නිසා සංචාරකයන් ද ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ ඇති පැහැදීම අඩුවේ. නැවත නැවත ශ්‍රී ලංකාවට පැමිණීම හෝ කට වචනය හා තම හිත මිතුරන්ට ලබාදෙන පණිවිඩය හෝ මග හැරී යනු ඇත. කෙසේ නමුදු නර්තනයේ යහපත් පැතිකඩ ඔස්සේ සිදු වන නව්‍යකරණ නිසා සංචාරක ක්ෂේත්‍රයේ අනාගතයත් පහතරට නර්තනයේ අනාගතයක් යන දෙකම තහවුරු වීම සිදුවේ. එහෙත් සනාතභාවය යන්න සොයා ඇදෙන සංචාරකයන්ට එය අවාසිදායක තත්වයක් වේ. සංචාරක කර්මාන්තය පවත්වාගෙන යාමේ දී නව්‍යකරණය ද අත්‍යවශ්‍ය කරුණක් වේ.

මේ ආකාරයට පහතරට නැටුම සංචාරක කර්මාන්තයේ ආකර්ෂණය වැඩිදියුණු කරගැනීම සඳහා යොදාගනු ලබන අංගයක් ලෙස ධනාත්මක ලෙසින් බලපාන අතරම ලෝකයට ශ්‍රී ලංකාවේ අනන්‍යතාව රැගෙන යන සංකේතයක්ද වෙමින් පවතී. සංචාරක කටයුතු ප්‍රවර්ධන වැඩසටහන් සෑම එකකම පාහේ පහතරට නැටුම් අංග ප්‍රදර්ශනය වීම ඊට නිදසුන් සපයයි. ඉන්දියානු සිනමා උළෙල 2012 ලංකාවේ පැවැත්වූ ෂෂ් හිදි පහතරට නර්තන අංග හා සුපිරි ඉන්දීය නළු නිළියන් සමග තෙල්මේ නර්තන ශිල්පීන් ජායාරූපයට පෙනීසිටීම (මුදාදෙණිය,2012:12). 2014 පැවති පොදුරාජ්‍ය මණ්ඩල සමුළුවේ සමාරම්භක උළෙල සඳහා පහතරට නාගරාක්ෂ, තෙල්මෙ නටුම් අංග යොදා ගැනීම එහි තරුණ සමුළුවටත්, අවසාන සංස්කෘතික ප්‍රසංගයටත් පහතරට නර්තන අංග යොදා ගැනීම් ඉහත කරුණු සපථ කරන බව තවදුරටත් පෙන්වා දිය හැකිය. මෙලෙසින් ආකර්ෂණයක් ලෙස පහතරට නැටුම් ක්‍රියාකාරීත්වය මනාව පෙන්වා දිය හැකි අතරම පවතින යම් යම් අඩුලුහුඩුකම් මගහරවා ගැනීම තුළින් ජපානයේ නෝ, කබුකි, ඉන්දියාවේ භාරත, කථකලී, මණිපුරි, වැනි ලෝක ප්‍රසිද්ධ නර්තන කලාවක් බවට පත් වීමට ශ්‍රී ලාංකීය පහතරට නර්තන කලාවට හැකියාව පවතී.


**හඳුනාගත් නව පරාස**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා පහතරට නර්තන සම්ප්‍රදාය යොදා ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීමේ දී සිදුකළ සම්මුඛ පරීක්ෂණ හරහා සංචාරකයාට පහතරට නැටුම් දැක ගැනීමට නිසියාකාර ස්ථාන නොවීමත් මනා පුහුණුවකින් හා ප්‍රවීණතාවයකින් යුතු ශිල්පීන් ක්ෂේත්‍රයේ නියුතු නොවීමත් සම්ප්‍රදායේ සත්‍යතාව රැකගැනීම පිළිබඳවත් හඳුනාගත හැකි විය . නිශ්චිත නීති රාමුවක් යටතේ ප්‍රවීණතාවයකින් යුතු ශිල්පීන් ඒකාබද්ධ කර ගනිමින් නැටුමේ යථා ස්වරූපය ඉස්මතු කරමින් නර්තන ප්‍රසංග ඉදිරිපත් කිරීම හරහා සංචාරකයා නර්තනයටත් ලාංකීය සංචරණයටත් යොදාගත හැකි බව ක්ෂේත්‍රය දියුණු බොහෝ දෙනෙකුගේ මතයයි.

ක්ෂේත්‍ර ගවේෂණ හරහා වර්තමානයේ සුළුවෙන් හෝ පහතරට නර්තනය යොදා ගන්නා නර්තන ප්‍රසංග නැරඹීමේ දී හඳුනාගත හැකි වූයේ නර්තනය මුළුමනින්ම නවීකරණයට ලක්වී ඇති බවයි. එමෙන්ම පහතරට නර්තනය තුළ පවතින විවිධත්වය එනම් වෙස්මුහුණු භාවිතය, ගිනි සිසිල ,පන්දම් පාලිය වැනි

නර්තන අංග අලංකාර වස්ත්‍රාභරණවලින් සමාරෝපනය වන තෙල්මෙ, පත්තිනි, වාහල වැනි නර්තන අංග ගැනීමට හැකියාව පැවතිය ද යම් යම් සංගීත ඛණ්ඩ වලට නව නිර්මාණ ඉදිරිපත් කිරීම තුළින් සංචාරකයාට ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය පිළිබඳ වැටහීමක් හෝ ආකර්ෂණය වීමක් සිදුනොවේ. ත්‍රාසයජනක හා විස්මය ජනක අංග කෙතරම් තිබියදීත් ඉතා අලසකමින් ගලා යන විවිධ රටවල නර්තන ශෛලීන් අනුකරණය හරහා සංචාරකයා නැවත නැවතත් ශ්‍රී ලංකාව පිළිබඳ ලෝකයට ගෙන යාමක් සිදු නොකරයි.

ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු ලබාදුන් සංචාරකයින් අතර ඉන්දියානුවෝ 27% ක ප්‍රතිශතයක් වූ අතර පෝලන්තය 20%, රුසියාව 2%, එංගලන්තය 10%, ජර්මනිය 10%, යුක්රේනය 6%, චීනය 6%, නෙදර්ලන්තය 6%, ඇමරිකාව 4%, ක බෙල්ජියම 2%, ඩුබායි 2% ක් වශයෙන් රටවල් එකොළහක සංචාරකයින් මේ සඳහා සහභාගි විය (1 වගුව)





1 වගුව දත්ත සැපයීම සඳහා සහභාගි වූ විදේශ සංචාරකයන් (ප්‍රතිශතයක් වශයෙන්)

ශ්‍රී ලංකාව තුළ සංචාරය අතර මග ශ්‍රී ලාංකීය නැටුම් කලාවන් නැරඹීමට කැමති පිරිස් විසීමේ දී 90% කැමැත්තක් දක්වන අතර 10% අකමැත්ත ප්‍රකාශ කරයි. මේ අනුව බොහෝ දෙනා ශ්‍රී ලංකාවේ නැටුම් වල පවතින විවිධත්වයට කැමැති බව ප්‍රත්‍යක්ෂ විය (1 රූපය). වර්තමානයේ නර්තනය සංචාරක ක්ෂේත්‍රයට යොදාගෙන තිබෙන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිශතයකින් මින් ඉදිරියට යොදාගත හැකි බවද ගම්‍යමාන වෙයි. මනසට හා ගතට විවේකයක් පතා වෙරළ තීරය කරා ඇදෙන සංචාරකයන් පවා නැටුමට ලැදියාවක් දක්වන බව හා ඔවුන්ට බාධාවක් නොවන බවත් මනසට සුවයක් ලෙසත් සැලකීම වාසිදායක තත්ත්වයකි. මේ නිසා ඕනෑම අවස්ථාවක සංචාරකයන් වෙත ලබාදීමට සුදුසු නිෂ්පාදිතයක් ලෙසද නර්තනය හඳුනාගත හැක. ත්‍රාසජනක සංචාරණය ට කැමති පිරිස්, විනෝදාස්වාදය උදෙසා පැමිණෙන සංචාරකයින් ද ආදී වශයෙන් කිසිදු වෙනසකින් තොරව නර්තනය ඕනෑම කාණ්ඩයකට ගැළපෙන ලෙස යොදා ගත හැකි බව මින් ප්‍රත්‍යක්ෂ වේ. මන්ද යත් පහතරට නර්තනය තුළ විනෝදාස්වාදයද, ත්‍රාසයද සංස්කෘතික අනන්‍යතාවය ද


එකසේ ගැබ්වී තිබේ. තම සංචාරය තුළදී ලාංකීය නැටුම් නැරඹීම 90% ක්ම කැමැත්ත දක්වා තිබීම ඊට නිදසුනක් ලෙස ගම්‍ය කරගත හැක.

ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිටම ශ්‍රී ලාංකීය නැටුම් නැරඹීමට සැලැසුම් කල පිරිස් අතරින් 90% වේ. සැලැසුම් නොකරපු පිරිස 10%කි. මෙය ඉතා හොඳ ප්‍රවණතාවයකි මන්දයත් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිටම ලාංකීය නැටුම් නැරඹීම්ට සැලසුම්සහගත වම වැඩි ප්‍රතිශතයක් කටයුතු කිරීම යහපත් ලකුණකි. එමෙන්ම කිසියම් ගමනාන්තයකට පැමිණීමට පෙර සංචාරකයන් අදාළ රට පිළිබඳ හා අනෙකුත් කරුණු පිළිබඳ මනා දැනුවත් භාවයක් ලබා ගන්නා බවද ඉන් තහවුරු වේ.




**1 රූපයඃ දේශීය නර්තන නැරඹීම සඳහා විදේශීය සංචාරකයන්ගේ නැඹුරුව**

එමෙන්ම ශ්‍රී ලංකාවට පැමිණි ඔවුන් නැරඹීමට බලාපොරොත්තු වූ නැටුම් අංග මොනවාද යන්න විමසීමේදී වැඩි ප්‍රතිශතයක් එනම් පහතරට වෙස්මුහුණු නැටුම්වලට 32% ද ගිනි සිසිල සඳහා 32% ද වශයෙන් සමාන කැමැත්ත ප්‍රකාශකර ඇත. උඩරට වෙස් නැටුම් 20% ද තෙල්මෙ නැටුම් 12% ක්ද ගැමි නැටුම් වලට 2% වඩිගපටුන 2% ද වශයෙන් ප්‍රතිචාර දක්වා ඇත (2 රූපය). මේ අනුව උඩරට වෙස් නැටුම කෙතරම් ප්‍රසිද්ධ වුවත් පහතරට නැටුමේ ඇති විවිධත්වය, විචිත්‍රත්වය හා ත්‍රාසජනක බව නිසාත් වැඩි දෙනාගේ දැක ගැනීමේ බලාපොරොත්තුව ඇති නර්තනය සඳහා ඇති ප්‍රවර්ධනය මදකම ප්‍රධාන ගැටලූ බව පෙනේ . මින් ගම්‍ය වන තවත් කරුණක් නම් වර්තමාන සංචාරක ප්‍රජාව ත්‍රාස සංචරණය නොකළත් සංස්කෘතික සංචරණය හරහා වුවද ත්‍රාසජනක දේ නැරඹීමට කැමැත්තක් ඇති බවය. එනම් පහතරට වෙස්මුහුණු හා ගිනි සිසිල නර්තන අංග හරහා ඒ අවශ්‍යතා ඉෂ්ට කර ගන්නා බවය.





**2 රූපයඃ පහතරට නර්තනය කෙරෙහි විදේශීය සංචාරකයන්ගේ නැඹුරුව**

සංචාරක කර්මාන්තය තුළට නර්තනය යොදා ගැනීමත් එය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ සුදුසු මාධ්‍යයක් ද යන්න විමසීමේදී 100% ක ප්‍රතිශතයක් ම දරන අදහස් වූයේ සුදුසු බවයි ඒ අනුව ලෝකය පුරාම නර්තනය සංචාරක කර්මාන්තය හා බද්ධ කර ඇත්තේ මේ නිසා බව පසක් වෙයි. ඕනෑම සංචාරකයෙක් යම් රටක නැටුම් කලාවන් රසවිඳ අදාළ රට පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගැනීමටත්, අමතක නොවන අත්දැකීමක් ලබා ගැනීමටත් කැමැත්තක් දක්වයි. මෙයට උපක්‍රමයක් ලෙස විවිධ රටවල නර්තන ප්‍රසංග, තරගාවලි හා සම්මන්ත්‍රණ පවත්වා නර්තනයට කැමැති සංචාරකයින් තම රටවලට ආකර්ෂණය කර ගැනීම සිදු කරයි. පහතරට නැටුම ද සංචාරක කර්මාන්තය තුළට අන්තර්ගත කළ යුත්තේ මේ නිසාම වේ. විවිධ රටවල ඇදී යන සංචාරක ප්‍රජාව හා ඒ හරහා නව අත්දැකීමක් උදෙසා ශ්‍රී ලංකාවට ආකර්ෂණය කරගැනීමට හැකි වේ.

චන්දන වික්‍රමසිංහ මහතාගේ ද අදහස් වන්නේ නර්තනය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනයය කර ශ්‍රී ලංකාවට තවදුරටත් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමත් ශ්‍රී ලාංකීය නැටුම් සලකුණට ලෝකය තුළ අනන්‍යතාවක් ලබා දීමට එමෙන්ම පහතරට නර්තනය වනාහි ඒ සඳහා යොදාගත ගත හැකි ප්‍රධාන කලාව බව අවධාරණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නුදුරේදීම නර්තනය නිසා විශිෂ්ට සංචාරක ගමනාන්තයක් විය හැකි බව අනුමාන කල හැක.

ශ්‍රී ලංකාවේ නර්තන සම්ප්‍රදායන් ගැන ඔවුන් දරන අදහස අනුව වැඩි ප්‍රතිශතයක් එනම් 80% ඉතා හොඳ බවට පිළිතුරු ලබා දී ඇත. 14% හොඳ 6% නරක බවට පිළිතුරු ලබා දී ඇත (3 රූපය). කෙසේ වෙතත් වඩා හොඳ ප්‍රතිචාරයක් ලැබී ඇති නිසා තවදුරටත් සැලකිලිමත් වීම තුළින් ශ්‍රී ලංකාවේ නර්තනය සමස්ත

වශයෙන් යහපත් බවට පත්කරගත හැක. එමෙන්ම නරක බවට අදහස් දැක්වූ බොහෝ දෙනා ඉන්දියානුවන් වේ. එරටේ පවතින භරත, කථක්, කථකලී, මණිපූරි වැනි නර්තන කලාවන් සාපේක්ෂව ශ්‍රී ලංකාවට වඩා ලෝක ප්‍රසිද්ධ විදග්ධ නර්තන කලාවන් වේ. ඒ නිසා ශ්‍රී ලාංකීය නර්තන යම් විශේෂත්වයක් නොපෙනීම සාමාන්‍ය කරුණකි. ඉන්දියාව වැනි රටකින් පැමිණෙන සංචාරකයන් ප්‍රමාණයත් ඔවුන්ගෙන් ලැබෙන ආදායමත් සංසන්දනය කළ විට අනෙක් රටවල සංචාරකයන් ශ්‍රී ලංකාවේ නර්තනයට ආකර්ෂණය කර ගැනීම ඉතා වැදගත් වේ. මන්දයත් ආසියාතික රටක් වන ඉන්දියාවට වඩා යුරෝපානු රටවල් හරහා ලැබෙන ආදායම වැඩිය. ඉන්දියාව වැනි රටක සුළුතරයක් එවැනි අදහස් ප්‍රකාශ කිරීම එතරම් බලපෑමක් එල්ලවන පිළිතුරක් ලෙස සිතීමට නොහැක. ප්‍රවර්ධනය කිරීමේ දී ඉන්දියාව වැනි සුවිශේෂී නැටුම් කලාවන් පවතින රටවලට පහතරට නර්තනය ප්‍රවර්ධනය සීමා කර අනෙක් රටවලට ප්‍රවර්ධන කටයුතු කිරීම හරහා හොඳ ප්‍රතිඵල ලබාගත හැකි බව මින් හඳුනාගත හැක.




**3 රූපයඃ සංචාරක ව්‍යාපාරයෙහි ආකර්ශනීය බව වැඩිදියුණු කිරීම සඳහා නර්තනය යොදාගැනීමේ ඇති ඵලදායීතාව**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ පහතරට නර්තන කලාව පවතින ආකාරය සොයා බැලීමටත් එහි ප්‍රවර්ධනය සඳහාත් අවශ්‍ය පසුබිම් හදා ගැනීමට ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමෙන් ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් හඳුනාගත හැකිවිය. එනම් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් බොහෝමයක් දෙනා ලංකාවේ නැටුම් කලාවන් පිළිබඳ අවබෝධයකින් යුතුව පැමිණෙන අතර ලංකාවේ නැටුම් කලාවන් අතර වැඩිමනක්ම පහතරට නැටුම් කලාවේ වෙස්මුහුණු පැළඳ සිදුකරන නර්තනයන්ට ගින්දර භාවිත කර සිදු කරන පන්දම් පාලිය, ගිනි සිසිල නර්තනාංගයන්ටත් විචිත්‍රත්වයෙන් යුත් ඇඳුම් පැළඳුම් හා පැන්නුම් කැරකිලි වැනි සංකීර්ණ අංගහාර ඇතුලත් තෙල්මේ, දෙවොල් වැනි නර්තන අංගවලට කැමැත්ත දක්වන බවයි. එමෙන්ම ඔවුන් පහතරට නර්තනය ලංකාවේ දී ඉගැනීමට වුවද කැමැත්තක් දක්වයි. පහතරට නැටුම් හෝ වෙනත් නැටුම් කලාවක් නව්‍යකරණයට බඳුන් වන වනවාට සංචාරක ප්‍රජාවගේ කැමැත්තක් ද නැත.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ නර්තන කලාවන් පිළිබඳ දැනුමක් නොමැති සහ තැකීමක් නොකරන පිරිස් සිටිනුයේ ඉතාමත් අඩු ප්‍රතිශතයකි. ලංකාවේ නර්තන කලාවන් හොඳ තත්ත්වයක නොමැති බව ප්‍රකාශ කරන්නේද ලංකාවට ආකර්ෂණය වීම හරහා එතරම් වාසි නොලැබෙන රටවල් කිහිපයක පිරිස්ය.

සමස්ත විශ්ලේෂණය තුළින් පහතරට නර්තනය ලංකාවේ සංචාරක කර්මාන්තය තුල ප්‍රවර්ධනය කිරීම තුල හඳුනාගත හැකි ගැටලු කිහිපයකි. එනම් පහතරට නර්තනය ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන නොතිබීම, නව්‍යකරණය තුළ පහතරට නර්තන කලාවේ අනන්‍යතාවයට හානි සිදුවීම, සංචාරකයන් වෙනුවෙන් පහතරට නර්තන ප්‍රසංග පැවැත්වීමට වෙනම ස්ථානයක් නොවීම මෙම පහතරට නර්තනය ඉගෙනීමට කැමති සංචාරකයන් වෙනුවෙන් ස්ථාන නොවීම, සංචාරක කර්මාන්තය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති කම නිසා දක්ෂ ශිල්පීන් ක්ෂේත්‍රයට නොපැමිණීම, පහතරට නර්තනය සංචාරක කර්මාන්තය තුළ දී ආරක්ෂා කර ගැනීමට නීතිමය රාමුවක් නොමැති වීම ආදියයි. කෙතරම් දුර්වලත්වයන් වර්තමානයේ මේ තුළ දක ගත හැකි වුවත් නිසි ලෙස ප්‍රවර්ධනය හා යොදා ගැනීම සිදුකරන්නේ නම් පහතරට නර්තන කලාව සංචාරක කර්මාන්තය සඳහා යොදා ගත හැකි ශක්‍යතා ද පවතී. ඒවා නම් පහතරට නැටුම අනිත් නර්තන කලාවට වඩා පවතින විවිධත්වය දකුණු පළාත පහතරට නර්තන කලාවේ නිජබිම බැවින් දක්ෂ පාරම්පරික ශිල්පීන් බොහොමයක් එහි සිටීම. සංචාරකයන් පහතරට නැටුම් නැරඹීමට ඉතාමත් කැමති වීම හා ඉගෙනීමට කැමති වීම එමෙන්ම වසරේ ඕනෑම කාලයක ඕනෑම අවස්ථාවක පහතරට නැටුම් ලංකාව තුළදී සංචාරකයන් වෙනුවෙන් ලබාදීමට හැකියාවක් පැවතීමයි.

**නිගමනය**

ඉහත සෑම කරුණක්ම අධ්‍යයනය කිරීම මගින් පහතරට නර්තන කලාව යනු ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා යොදා ගත හැකි වටිනා මෙවලමක් බව හඳුනාගත හැකිය. සංචාරක කර්මාන්තයේත් පහතරට නර්තනයේත් අනන්‍යතාව හා යහපැවැත්ම තිර වන අයුරින් ප්‍රවර්ධන කටයුතු කිරීම හරහා වර්තමානයේ ලංකාවට ආකර්ෂණය වන සංචාරකයන්ට වඩා වැඩි ප්‍රමාණයක් ගෙන්වා ගත හැකි වෙයි. ඒ සඳහා සහය කර ගත හැකි යෝජනා ලෙස පහතරට නර්තන ශිල්පීන් දැනුවත් කිරීම, ප්‍රවර්ධනය සඳහා පහතරට නැටුම් යොදා ගැනීම, සංචාරකයන්ගේ කාල සටහන තුළට නර්තන නැරඹීමට වෙලාවක් වෙන් කිරීම, නව සංකල්ප යටතේ ප්‍රවර්ධනය, පහතරට නර්තන ප්‍රසංග පැවැත්වීමට ස්ථාන වෙන් කිරීම, නීතිමය රාමුවක් ඇති කිරීම, පර්යේක්ෂකයන්ට නව විෂය පථයක් ලෙස පහතරට නැටුම්හි මනෝ විද්‍යාත්මක පදනම හඳුන්වා දීම ආදිය පෙන්වාදිය හැක. කෙසේ වෙතත් වර්තමානයේ සංචාරක කර්මාන්තය තුළ ප්‍රවර්ධනය කිරීමේදී වැඩි අවස්ථාවක් ලබාදිය යුතු නර්තන කලාව කුමක්ද යන්න හරිහැටි තේරුම් ගෙන නොමැත. එමෙන්ම උඩරට හා විදේශීය නර්තන කලාව නොවන දේ ඇත. පහතරට නර්ථන කලාව මගින් කර්මාන්තයට ලබා ගත හැකි දෑ පිළිබඳ අවබෝධයක් වගකිව යුතු පාර්ශවයන්ට නොමැත. පවතින තත්ත්වයට වඩා සංචාරක කර්මාන්තය තුළ ප්‍රචාරණ කටයුතු සඳහා නිෂ්පාදිතයක් ලෙසත් පහතරට නර්තනය යොදා ගැනීමට අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම හරහා

සංචාරකයන්ගේ ඉහළ ප්‍රතිචාරයක් ශ්‍රී ලංකාවට ලබාගත හැකි බව අවසන් වශයෙන් නිගමනය කළ හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ද්විතික මූලාශ්‍රය**

ඔබේවංශ, කේ. (1996) ***රුහුණු නැටුමේ සිද්ධාන්ත සමීක්ෂණය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

දළුවත්ත,සී,. ***පහතරට නැටුම්***, රුහුණු ප්‍රකාශකයෝ, කොළඹ 11.

පතිරණ, යු. පී. එස්,. (2006) ***සංචාරක ව්‍යාපාරය***, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.

මුදාදෙණිය, ඩී,. (2012) ***ඔබ නොදුටු අයිතා***, ප්‍රින්ටඩ් පුද්ගලික සමාගම.

**වාර්තා**

Weerathunga,U,(2013) Mega Tourism Road Show Report' Sri Lanka Tourism Promotion Bureau

**අන්තර්ජාල මූලාශ්‍ර**

Affrican Tourism Promotion Video (2014), Available From: htttp://www.youtube,com/watch?v=mhtnMzCzrXk Accessed [25/09/2014]

Bali Tourism Promotion (2014), Available From: htttp://www.youtube,com/watch?v=H2blMzgwVr8 Accessed [25/09/2014]

Community Tourism and Dancing (2014), Available From: http://www.travel/indonesia.com/> Accessed [10/09/2014]

Indian Tourism Promotion (2013) Available From: htttp://www.youtube,com/watch?v=KLwbm_f28eY>Accessed [31/08/2023]

Ministry of Economic development.(No date)Sri Lanka among world'sbest six Tourism destinations-*National Geographic,Ministry of economic development* (Online).Available at http://med.gov.lk/english/?p=9130 Accessed [02/08/2023]

News.lk (2003) Caravan Arries at its Third Destination-Dnepropetrovsk*, The official government news portal of sri lanka* (Online) Available at http://www.news.lk/sri-lanka/7097-caravan-arrives-at-its-third-destionation-dnepropetrovsk-> Accessed [14/10/2014]

Skyscrapercity.com.(no date). Tourism,Photos & Heritage Showcasing Sri Lanka to the worl beyond, Skyscrapercity.com (Onbeyond, Skyscrapercity.com//www. Skyscrapercity.com/showthread.php?t=416245&page=8>Accessed [14/11/2023]

Sri Lanka Tourism Development Authority. (No date), http://www.sltda.gov.lk> Accessed [14/11/2023]